# තිත්ත වූ ඇත්ත



මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය

**'මුහුදට** ආ වැඩීමක් නොවේ ' යනුවෙන් මා ලියූ ලිපියට ආවේගාත්මකව පිළිතුරු සැපයූ අනන්‍යතාව හෙළි නොකළ වෛද්‍යවරයාට පිළිතුරක් නොලියුවහොත් එය ඔහුගේ වැරදි වැටහීමට ඉනිමං තැබීමක් වේයැයි සිතෙන නිසා මෙසේ ලියන්නට තීරණය කළෙමි.

පළමුව ලිපියේ මාතෘකාවේ අරුත තේරුම් ගන්නට තරම්වත් සිංහල භාෂාව ගැන වැටහීමක් නැති සිංහල වෛද්‍යවරයකු ගැන පුදුමයට පත් වුවද, සිංහල පුවත්පතක පැහැදිලි සිංහලෙන් පළවූ මගේ ලිපියට ඉංග්‍රීසියෙන් සිංහල වචන ලියමින් ඉංග්‍රීසියෙන් පිළිතුරු සැපයූ වෛද්‍යවරයා ගැන කණගාටුවක් ද නොහිතුණා නොවේ.

අපේ සංස්කෘතිය, සභ්‍යත්වය, ශිෂ්ඨාචාරය ගැන මහා ඉහළින් කතා කරන, ඒ අනුව ජීවිත හැඩ ගස්වා ගන්නට යත්න දරණ අපේම සිංහලයන් සමහරක් අගය කළ යුත්තක් අගය කිරීමට මෙතරම් මැලි වන්නේ ඇයිද යන්න තේරුම් ගැනීමට අසීරු කරුණකි. එසේ පසු බසින එක් සිංහලයකුගේ විවේචනයක් ලෙස මිස, ඉන් ඔබ්බට ඔබ ලිපියෙන් මට උකහා ගත හැකි යමක් නොවීය. මගේ ලිපියේ ගැන ඔබ කෝප වූයේ සමහරවිට මා ඔබ ක්ෂේත්‍රය ගැන කතා කළ නිසා විය හැකිය. නමුත් ඔබ ක්ෂේත්‍රය ගැන කතා කිරීමට මා ද වෛද්‍යවරියක වීම අත්‍යාවශ්‍ය නැත.

තවමත් මා පුවත් පත් කලාවේ අත්පොත් තබන්නෙකු විනා එහි ප්‍රවීණයෙකු නොවන නමුදු ඕනෑම තරාතිරමක කෙනෙකුගේ සාධාරණ විවේචන, මග පෙන්වීම් බොහෝ නිහතමානීව පිළිගැනීමට මම සෑමවිටම උත්සාහ දරමි. වසර ගණනාවක සිට විවිධ ක්ෂේත්‍රයන්ට අදාලව සිදුවන සමාජ අසාධාරණයන්ට, අක්‍රමිතාවන්ට එරෙහිව නොයෙක් අන්දමේ ලිපි පුවත්පත් වලට යොමු කළද, කිසිම දැන හැඳිනීමකින් තොරව ඒවා පළවූවේ ඒවායේ හරයක් ඇති නිසාවෙනැයි සිතමි.

පෞද්ගලිකව මට කිසිම දිනයෙක කිසිම වෛද්‍යවරයකු වෙතින් අසාධාරණයක් වී නැතත් මගේ සමීපතමයන්ට, දැන හඳුනන්නන්ට මෙන්ම රටේ ජනතාවට සිදුවූ අසාධාරණ නිරන්තරුවම කණ වැකෙන නිසාත්, අපේ වෛද්‍යවරුන් හෙදියන් සහ මෙහි වෛද්‍යවරුන් හෙදියන් අතර ඉතා පැහැදිලි වෙනසක් දැකීමත් මගේ ලිපියට අරමුණු කොට ගත්තා මිසෙක; වෛද්‍යවරුන් ගේ පවුල් පසුබිම, දැන උගත්කම හෝ සේවයේදී විඳින්නට සිදුවන අසාධාරණ මගේ ලිපියට අරමුණු වූයේ නැත. එමෙන්ම හිතවතුන් ගේ සාමීචියකදී වෛද්‍යවරියක ගැන හිතවතකු කී කතාව කිසිම විටෙක ඔහු ඇය ගැන පෞද්ගලික ද්වේෂයකින් නොකීවක් බව ද දනිමි.

පුවත්පතකට සපයන ලිපියකට අත්දැකීමක් පාදක කර ගනිද්දී මා කිසි විටෙක මා දන්නා පුද්ගල නාම හෝ මගේ අනන්‍යතාව සඟවා නැත. එමෙන්ම මගේ කිසිදු ලිපියකට මා හිතළු කතාවන් ගොතා නැත. මන්ද, ඇත්ත ඇති සැටියෙන් පැවසීම අතිශයෝක්තියක් ඉදිරිපත් කරනවාට වඩා පහසු නිසාය. නමුත් පුවත්පතේ සදාචාරය රකිනු වස් යයි කියමින් සංස්කාරකවරයා විසින් කරනු ලබන නම්, ගම් කපා හැරීම් ආදී සංශෝධනය කිරීම් උදෙසා මා වගකීම් දරන්නේ ද නැත. ඔබේ ලිපියේ ඔබේ අනන්‍යතාව හෙළි නොවන්නේ ඔබේ ඉල්ලීමකට අනුව යයි ද සිතමි.

පසුගිය ලිපියේ මා සඳහන් කළ රෝගීන් පිළිගන්නා වෛද්‍යවරයා ගේ වාසගම සඳහන් වූයේ නිවැරදිව නොවේ. එනිසාම එම ඇගයීම සම්පූර්ණයෙන්ම ලැබුණේ වෙනත් වෛද්‍යවරයෙකුට වුවද ඉහත කී වෛද්‍යවරයා ගැන ඔහුගෙන් ප්‍රතිකාර ලැබූ සහ අදටත් ප්‍රතිකාර ලබන රෝගීන් සහතික වනවාට සැක නැත. නිවාඩුවකට හෝ ශ්‍රී ලංකාවට ගිය අවස්ථාවක වෛද්‍යවරයකු ලෙසින් නොව සාමාන්‍ය රෝගියෙකු ලෙසින් හෝ එම වෛද්‍යවරයා මුණ ගැසීමෙන් ඔබටද එහි සත්‍යතාව අවබෝධ කොට ගත හැකි ය.

මගේ ලිපියේ සඳහන් යැයි සැක කළ වෛද්‍යවරියක වෙනුවෙන් පෙනී සිටීමට ඔබ යත්න දරා ඇති නමුත් එහි සැබෑ තත්ත්වය නම් අප සමග එම සිදුවීම පැවසූ වෛද්‍යවරයා ඇය ගැන බොහෝ කලකිරීමෙන් කතා කළා මිස කිසිම පුද්ගල නාමයක් හෝ හැඩ හුරුකමක් හෝ පදිංචියක් ගැන කිසිම සඳහනක් කළේ නැත. ඇසුරේ සිටින වෘත්තීය සගයෙකු වශයෙන් වෛද්‍යවරිය විසින් ඔබට කරන ලද සැලකීමත් කිසිම දැන හැඳුනුම්කමක් නැති අයෙකු වෙනුවෙන් කළ සැලකීමත් අතර පරතරයක් තිබිය නොහැකි යැයි ඔබ සහතික කරන්නේ කුමන පදනමකින්ද?

ඔබේ ලිපියේ කරුණු එකින් එක විභාගයට ගනිමින් නිකරුණේ මේ ලිපිය දික් ගස්සවා මසකට වරක් නිකුත් වන මෙම පුවත්පතේ තවෙකෙකු වෙනුවෙන් වෙන්වන ඉඩකඩ කොල්ල කා ගැනීම මගේ අරමුණ නොවේ. නමුත් වෘත්තිකයෙකු වශයෙන් ඔබ සුදු හුණු උලා පිරියම් කරන්නට තැත් කළද, එසේ නොකළ හැකි බොහෝ තැන් ඇති වගට ඔබේ දැනගැනීම පිණිස මෙහි ලා සඳහන් කළ යුතු යැයි හැඟෙන කරුණු කාරණා කීපයකි.

ලංකාවේ වෛද්‍යවරුන් සියයට අනූනවයකගේම තත්ත්වය ඔවැනි යැයි සඳහන් කළ පමණින් මා අප රටේ වෛද්‍යවරුන් පිළිබඳ සංගණනයක් පවත්වා ඉන් සියයට එක කොටසකට ගරු නම්බු ලබා දුන්නා යැයි ඔබ කලබල විය යුතු නැත. ඔබ සමස්ථ වෛද්‍ය පරපුරටම චරිත සහතික දෙන්නට තැත් දැරුවාට වෛද්‍යවරුන්ගේ සේවය ගැන දන්නා හොඳම පුද්ගලයින් රෝගීන් බවද ඔබ දැන ගත යුතුමය.

ඔබ ලංකාවේද වසර දහයක පමණ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බව ඔබේ ලිපියෙන්ම දැන ගතිමි. එද ඔබෙන් පිහිට පැතූ රෝගීන්ට ඔබ කාරුණික වූවේ නම්; ඔවුන්ගේ රෝග විස්තර කිරීම් වලට ඉවසීමෙන් යුතුව සවන් දීමේ හැකියාවක් ඔබට තිබුණේ නම්.. අනිවාර්යයෙන්ම ඔබත් ඉන්නට ඇත්තේ අර රෝගීන් ප්‍රශංසා මුඛයෙන් කතා කරන සියයට එකේ කොටස තුළ ය. නමුත් ඔබ, රෝගියා කාමරයට ඇතුළුවත්ම බෙහෙත් ලියා හමාර කළ වෛද්‍යවරයෙකු විනි නම් රෝහලෙන් පිටවූ පසු ඔබ ගැන රෝගීන් පැහැදීමකින් කතා කරන්නේ නැත. එවැනි වෛද්‍යවරුන් ඉබේම තල්ලු වන්නේ අර සියයට අනූනවය තුළටය. ඔබ අයත් වූයේ මේ කුමන කොටසටදැයි මා දන්නේ නැත.

සොයුරාගේ නිවසේදී මට හමුවූ පිළිකා රෝගියා මට වීරයෙකු ලෙස පෙනෙන්නට ඇතැයි ඔබ සිතීමද හාස්‍ය දනවන සුළුය. එමගින් ඔබේ මානසික තත්ත්වයද අපූරුවට වටහා ගත හැකි විය. ඔබ මෙහි කෙතරම් කාලයක් ජීවත් වූවාදැයි මම නොදනිමි. නමුදු ඉතා මෑතකදී මෙරටට පැමිණි මමද කාර්යාලයීය අවශ්‍යතා මත එදිනෙද මුණ ගැසෙන බොහෝ මිනිසුන් සමඟ කතා කර ඇත්තෙමි. ආසියානු ගැහැණියකට ඇත්ත කියන්නට තරම් මෙහි මිනිසුන් විවෘත වන්නේදැයි ඔබ ප්‍රශ්ණ කර තිබූ නිසාම මම ඔබට මෙසේ කියමි. කොහොමටත් බටහිර රටවල්වල ජීවත් වන මිනිස්සු විවෘත සිතිවිලි ඇත්තෝ මිස, අනුන්ට ඕනෑ විදියට හෝ තව කෙනෙකු ඔවුන් ගැන කුමක් සිතාවිදැයි බියෙන් හෝ සැකයෙන් ජීවත් වෙන්නෝ නොවෙති. සමහර විටෙක ඔබ කියුවාක් මෙන්ම එම පිළිකා රෝගියාද මනෝ උපදේශන සේවාවක් මගින් හෝ ඔහුගේ මනස සැහැල්ලු කර ගන්නට ඇත. මනෝ උපදේශකවරයා ගේ දක්ෂකම මත හෝ තමන්ගේ ම වීර්යයෙන් හෝ මනස සැහැල්ලු කර ගන්නට ඇත. ඉතින් ඔබ එහි වරදක් දකින්නේ ඇයි?

ලංකාවේ ඉපිද, ලංකාවේ හැදී වැඩී, ලංකාවේම වැඩි කාලයක් ජීවත් වූ කෙනෙකු හැටියට ලංකාවේ මිනිසුන්ගේ සිතුම් පැතුම් මමද හොඳාකාරවම දනිමි. අපේ මිනිසුන් භයානක ලෙඩකදී හෝ සුව කළ නොහැකි යයි සම්මත රෝගයකදී මරණ වරෙන්තුව අතට ගන්නේ එය කර්මය ලෙස තේරුම් ගැනීම නිසා හෝ යථාර්ථවාදීව ජීවිතය දිහා බැලීම නිසාම හෝ නොව ඔවුන්ට වෙන කළ හැකි යමක් නැති නිසාය. වෛද්‍යවරුන් වෙතම විශ්වාසය තබමින් ඔවුන්ගේ වචනය දේව වාක්‍යය මෙන් අදහන නිසාය. ඇත්ත ඇති සැටියෙන් තේරුම් ගැනීම පසෙක තබා පන්සල්, පල්ලි, කෝවිල්, දේවාලගානේ ඇවිදිමින් බාරහාර වෙමින් දෙවියන් උදෙසා කන්නලව් කරන්නේද එමගින් හෝ සහනයක් බලාපොරොත්තුවෙනි. මානසිකව සහන සලසන මනෝ උපදේශන සේවාවක් එක රෝගියෙකුට හෝ ලබා දෙන්නේ නම් ඔවුනට හෝ ඔවුන් වෙනුවෙන් තැවෙන සමීපතයින්ට සැබවින්ම එය සහනයක් වනවා නොඅනුමානය.

ඔබ මනෝ උපදේශනය හදරා ඇති කෙනෙකු නම්... ඔබ ලංකාවේ ජීවත් වන්නෙක් නම්.. රෝගියෙකු වෙනුවෙන් කිසිම අයකිරීමකින් තොරව එම සේවාව ලබා දෙන්නේද?

මිනිසුන්ට සිදුවන හොඳ හෝ නරක කර්මය මතම රඳා පවතින බව සත්‍යයක් වුවද කර්මයටම දිනන්නට ඉඩ නොදී ශරීර කොටසක් ඉවත් කර හෝ පිළිකාවන් වැනි ලෙඩ රෝග වලින් පවා සුවය ලබා ජීවිතය ජය ගත්තවුන් අපේ මිනිසුන් අතර ඔබට මුණ ගැසී නැතිද? ඔබ කියනා අයුරින් කර්මයට සියළු දේ භාර කර නිභඩව සිටින්නට නම් අපට වෛද්‍යවරුන් හෝ රෝහල් කුමකටද?

ඕනෑම ක්ෂේත්‍රයක නියැලෙන ඕනෑම පුද්ගලයෙකු අතින් වැරදීම්, අතපසුවීම්, අමතකවීම් සිදුවුණද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් රෝහලකින්, වෛද්‍යවරයෙකු හෝ හෙදියකගෙන් සිදුවන එවැනි දේ සෘජුවම බලපාන්නේ මනුෂ්‍ය ජීවිත වලට බව අමුතුවෙන් ඔබට පහදා දිය යුතු නැත.

නීතිඥ අර්සකුලරත්න තමන්ගේ මියගිය දියණිය වෙනුවෙන් ලක්ෂ ගණනින් මුදල් වියදම් කරමින් නීතිය හමුවට ගියේ දියණියගේ ජීවිතය යළි ලබා ගැනුමට නොවේ. එමෙන්ම ළමා රෝග විශේෂඥවරියකව සිට මෑත කාලයේ ජීවිතයෙන් සමුගන්නට සිදුවුණු වෛද්‍ය කාමලිකා අබේරත්න රිය අනතුරකින් පසුව ඒඩ්ස් රෝගියෙකු බවට පත්වුණේ අනතුරට සම්බන්ධ පුද්ගලයන් ඒඩ්ස් රෝග වාහකයන් නිසා නොවේ. නමුත් වෙද හෝ හෙද සේවයේ නොසැලකිලිමත් කමින් සිදුවුණු එවන් අහිමිවීම් අතපසුවීම් හෝ වැරදීම් යනුවෙන් පෙන්වා දී අත පිසදා ගත හැක්කේ කාටද?

වරෙක මගේ මවට ඇතිවූ හෘදයාබාධයකදී පෞද්ගලික සාත්තු නිවාසයකට රැගෙන ගියද ළඟම ඇති රජයේ රෝහලට රැගෙන යන ලෙස උපදෙස් ලැබුණු නිසා මීගමුව මූලික රෝහලට ඇතුළත් කළද ඔවුන් දුන් ඖෂධයක් නිසා ඇගේ සිරුර සීතල වී කතා කිරීමද නැවතිණ. මවගේ තත්ත්වය බරපතල වූ නිසා රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුළු කළේද ඔවුන්ගේම නියමයට අනුවය. පසුව දැඩි සත්කාර ඒකකයේ වෛද්‍යවරියක ඇයව මුණ ගැසෙන ලෙස මට දැන්වූ බැවින් මා එහිදීම ඇයව මුණ ගැසුණෙමි. මවගේ හෘදයාබාධයට හේතු වූ කාරණය පිරික්සනු වස් ඇය අප පවුලේ තොරතුරු ඇසූ විට පියා ජීවතුන් අතර නැති බවත්, මාත් එක් සොයුරියක් හැරෙන්නට අනික් අය ඕස්ට්‍රේලියාවේ පදිංචි බවත් දැනට මා සමග සිටින සොයුරියද සැමියා සහ දරු දෙදෙනා සමග සතියකින් එහිම පදිංචියට යන බවත් පැවසීමි.

ඇයගේ කතාබහෙන් අනතුරුව මා කැඳවූ හෙදියක් මවගේ පරීක්ෂණ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය බැවින් මුත්‍රා භාජනයක් සහ රුධිර පරීක්ෂණ යන්ත්‍රයක් පිටතින් රැගෙන එන ලෙස පැවසූ අතර ඒවා ලැබෙන තුරු මවට ප්‍රතිකාර කළ නොහැකි බවත් පැවසුවාය. අනතුරුව වසා දමා තිබූ ගබඩා කාමරයක් තෙක් මා කැඳවා ගෙන ගිය ඈ එහි තිබු දූවිලි ගැසුණු මුත්‍රා භාජනයක් පෙන්වා එවැනිම එකක් රැගෙන ආ යුතු බව පැවසුවාය. මීගමුව නගරය පුරාම ඇවිද අවසානයේ නගරයේ කෙළවරින් පිහිටි ඔසු සලෙන් එය ලබා ගත හැකි විණි. ඔසුසලේ සේවිකාව කී පරිදි එය පිරිමි අය සඳහා ප්‍රයෝජනයට ගන්නකි. මූලික රෝහලේ අළුතින් සැදූ කොටසට අවශ්‍ය අඩුපාඩුකම් ඔවුන් සපුරා ගන්නේ එලෙස බව එම සේවිකාව පැවසුවද මව සුව කර ගැනීමේ අරමුණ මූලික කරගත් මම එය මිල දී ගත්තෙමි. රෝගියාට නොගැලපෙන භාණ්ඩ සොයා එම ඔසුසලට පැමිණි පළමු තැනැත්තිය මා නොවන බවද ඔවුන් අවධාරණය කළහ. එදින උදෑසන ලංකාවට පැමිණි මා සොයුරාගේ බිරිඳට කතා කොට කොළඹින් රුධිර පරීක්ෂණ යන්ත්‍රයක් ගෙන්වා ගන්නා විට තරමක් වේලා ගත වුණද, මවගේ තත්ත්වයේ වෙනසක් ඇති වේ යැයි බියෙන් දැඩි සත්කාර ඒකකයේ දොරටුව අසලටම වී සිටියෙමි. මා දකින හෙදියන් වරින් වරම රුධිර පරීක්ෂණ යන්ත්‍රය ගැන විමසූ සෑම විටකම මා සිතුවේ මවගේ තත්ත්වය ඉතාමත් දරුණු අතට හැරෙමින් පැවතුණු බවයි. දුරකථනය මගින් මගේ සොයුරු සොයුරියන්වද සම්බන්ධ කර ගනිමින් ඒ පැය කීපය මා ගත කළේ මරණයට කැප වූවකු සේය.

රෝහලේ රාත්‍රිය ගත කරන්නට ඉඩ නොදීම නිසා දැඩි සත්කාර ඒකකයේ සිටි වෛද්‍යවරියට රුධිර පරීක්ෂණ යන්ත්‍රය බාර දුන් මා නිවසට යාමට පිටත් වූවේ පාන්දරින්ම නැවතත් රෝහලට එන අටියෙනුයි. නමුත් පැය බාගයක් ගත වන්නටත් මත්තෙන් රෝහලෙන් ලැබුණු දුරකථන ඇමතුමෙන් අම්මාගේ තත්ත්වය සතුටුදායක බවත් ඇයව වාට්ටුවකට ඇතුළත් කළ බවත් රාත්‍රියේ ඇය ළඟ කවුරුන් හෝ නතර විය යුතු බවත් කියැවිණි. මිල අධික එම භාණ්ඩ ලබා ගන්නා තුරු අම්මාව දැඩි සත්කාර ඒකකයේ රඳවා තබා ගත්තා විනා වාට්ටුවට ඇතුළත් කළ පසුව වුවද පෙනඩෝල් පෙති දෙකක් හැරුණු විට අම්මාට ඔවුන් දුන් වෙන බෙහෙතක්ද නැත.

මවගේ ප්‍රතිකාර සඳහාම යැයි කියමින් ගෙන්වා ගත් පිරිමි රෝගීන් සඳහා ප්‍රයෝජනයට ගන්නා

34 වන පිටට

සෙන්ට්ඕල්බන්ස් පාරමිතා බෞද්ධ විහාරය
නව විහාරස්ථානය

බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය මගින් 1999 වසරේදී ආරම්භ කරනලද සෙන්ට්ඕල්බන්ස් පාරමිතා බෞද්ධ විහාරය සියලු විහාරාංගයන්ගෙන් සමන්විත විහාරස්ථානයක් බවට පත්කර ගැනීම සඳහා ඔබ සැමගෙන් ලැබුණු ආධාර අනුග්‍රහය මත මේ වනවිට නිවසක් සමග භූමිභාගයක් මිළදී ගැනීමට හැකිවී තිබේ. එම විහාරස්ථානයට ගෙවදීම දෙසැම්බර් මස 10 වෙනි සඳුදින සිදුකෙරේ. දැනට කුඩා විහාර මන්දිරයක් ඉදිකොට විහාරස්ථානය විවෘත කිරීම මුල්කොට ගෙන දෙසැම්බර් මාසයේ අවසානයේ දී පිංකම් මාලාවක් ඇරඹේ.

දෙසැම්බර් 29 - රාත්‍රී 7.30 අටවිසි ගිලන්පස බුද්ධ පූජාව
සහ රාත්‍රී 9.00 සිට පසුදින පහන්
වනතුරු සර්ව රාත්‍රික පිරිත් දේශනය.
දෙසැ. 30, 31 - රාත්‍රී 7.30 අටවිසි ගිලන්පස බුද්ධ පූජා
ජනවාරි 01 - උදේ 9.30 ට කිරි ආහාර බුද්ධ පූජාව
දහවල් 11.30 ට බුද්ධ පූජාව
රාත්‍රී 7.30 අටවිසි ගිලන්පස බුද්ධ පූජාව

විහාරස්ථානයක් ඉදි කිරීම සදා කල්හි පිංසිදුවන උතුම් පිංකමකි. ඔබ සැමට ද එම පිංකම සඳහා සහභාගී වන මෙන් මෙයින් ආරාධනා කර සිටිමු.

නව විහාරස්ථානය ඩියර්පාර්ක් සහ මෙල්ටන් අතර රොක්බෑන්ක් ප්‍රදේශයේ අංක 181, Paynes Rd හි බැලරාට් මාර්ගයේ සිට මීටර් 400 දුරින් පිහිටා ඇත. වැඩි විස්තර සඳහා අමතන්න. 93660333 හෝ 041 3776 534 විහාරස්ථානයේ දුරකතනය 9747 1902